41

# සංචාරක ව්‍යාපාරය දක්ෂිණ ලංකාවේ සංස්කෘතියට කර ඇති බලපෑම

*හේමමාලි, කේ. ජී. එස්.*[1]

ශ්‍රී ලංකාව වැනි තුන්වන ලෝකයේ රටවල දළ දේශීය ආදායමෙන් සැලකිය යුතු ප්‍රමාණයක් සංචාරක ව්‍යාපාරය තුළින් පියවා ගැනේ. සේවා වියුක්තියට පිළියමක් ලෙස හා අඩු වියදමක් මත ආදායම් වැඩි කර ගත හැකි වීමත් යන හේතූන් නිසා සංචාරක ව්‍යාපාරය වර්තමානය වන විට ආර්ථික ප්‍රතිලාභ සහිත කර්මාන්ත අතර ඉදිරියට පැමිණ තිබේ. එහෙත් ආර්ථික වර්ධනය විෂයයෙහි සැලකිය යුතු දායකත්වයක් සැපයෙන සංචාරක ව්‍යාපාරය මඟින් මෙරට සංස්කෘතිය කෙරෙහි කිසියම් ඍණාත්මක බලපෑමක් සිදුවෙමින් පවතී. එමඟින් වඩාත් බලපෑම් එල්ල කෙරෙන්නේ මෙරට පහතරට සංස්කෘතිය කෙරෙහි ය. ඒ අනුව මෙම පර්යේෂණයේ දී අවධානය යොමු කෙරෙන්නේ සංචාරක ව්‍යාපාරය මඟින් මෙරට දකුණු පළාතේ වෙරළාසන්න ප්‍රදේශවල සංස්කෘතිය කෙරෙහි ඇති වන බලපෑම් පිළිබඳ ව ය. සංචාරක ව්‍යාපාරය පිළිබඳවත් මෙරට සංස්කෘතිය පිළිබඳවත් විවිධ පර්යේෂණ සිදු වී ඇතත් සංචාරක ව්‍යාපාරය දක්ෂිණ ලංකාවේ සංස්කෘතියට කර ඇති බලපෑම පිළිබඳ ව මෙතෙක් කිසිදු පර්යේෂණයක් සිදු වී නොමැති වීම මෙම පර්යේෂණය කෙරෙහි මා යොමු වීමට විශේෂ හේතුවක් විය. සංචාරක ව්‍යාපාරය පිළිබඳ නව දැක්මක් සහිත ප්‍රවීණ විද්වතුන්, හෝටල් කළමණාකරුවන් සහ සේවකයන්, දක්ෂිණ ලංකාවේ සංචාරක ව්‍යාපාරය වඩාත් ප්‍රචලිත ව පවතින ප්‍රදේශවලින් තෝරාගත් ජන කණ්ඩායම් සහ සමාජ සංස්කෘතික ගවේෂකයන් සමඟ සිදු කෙරෙන සම්මුඛ සාකච්ඡා හා ඔවුන් වෙත යොමු කෙරෙන ප්‍රශ්නාවලි මඟින් අදාළ දත්ත රැස් කෙරිණි. ඊට අමතර ව සංචාරක කර්මාන්තය අලළා රචනා කෙරුණු පොත්පත් මෙන් ම අන්තර්ජාලගත තොරතුරු ද භාවිතයට ගැනිණි. ආර්ථික වර්ධනය විෂයයෙහි දැවැන්ත මෙහෙයක් සිදු කරන සංචාරක ව්‍යාපාරය හේතුවෙන් විපර්යස්ත වී ඇති දක්ෂිණ ලංකාවේ සංස්කෘතිය පිළිබඳ ගවේෂණය කිරීමේ අරමුණෙන් සිදු කෙරුණු මේ පර්යේෂණය මඟින් වෙරළාශ්‍රිත ප්‍රදේශවාසීන් සංචාරකයින් අනුකරණයට පෙළඹීම සහ සාම්ප්‍රදායික රැකියාවන් අභාවයට යාම, එම ප්‍රදේශවල ගණිකා වෘත්තිය, මත්ද්‍රව්‍ය භාවිතය, සමලිංගික සේවනය වැනි ක්‍රියාවන් ව්‍යාප්ත වීමෙන් සදාචාරාත්මක පරිහානියක් ඇති වීම යන බලපෑම් සිංහල සංස්කෘතිය මත පතිත වී ඇති ආකාරය හඳුනාගත හැකි විය.

ප්‍රමුඛ පදඃ සංචාරක ව්‍යාපාරය, දක්ෂිණ ලංකාව, සංස්කෘතිය, ආර්ථිකය, විපර්යස්ත වීම

*1 ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර, සිංහල අධ්‍යයනාංශය,* s.h.kahandagamage@gmail.com